ත්‍රෛමාසික මෙහෙවරක අන්තර්ජාල ප්‍රකාශය

දීප්ති

2023 ජූලි - සැප්තැම්බර් කලාපය

රාජ්‍ය සේවය කියන 'සුදු පිරුවටය' - 02/03

මගේ අතින් කිලිටි වෙලා නෑ - 02/03

මහ පොළොවෙන් රන් අස්වනු රටට දෙන ගණිත සර් - 13/14

සබරගමුවේ ඉතිහාසය ලොවට කියන ලෙනගල රජමහා විහාරය - 16

පන්හිඳක මංසල - 11

සියල්ලටම වඩා දරුවන් - 18

ජායාරූපය
සසින්ත ප්‍රදර්ශාල
සංවර්ධන නිලධාරී

වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය ප්‍රකාශනයකි

ත්‍රෛමාසික මෙහෙවරක අන්තර්ජාල අකුරු ගැළපුම

ප්‍රාණ මංගල කලාපය එළිදකියි.

හුස්මත් සමග කරන ගනුදෙනුවකට එහා ගිය අන්තර්ජාල අකුරු ගැළපුම "ප්‍රාණ" ත්‍රෛමාසික සඟරාවේ මංගල කලාපය අගෝස්තු 10 වන දා ප්‍රාදේශීය ලේකම්තුමාගේ සුරතින් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී අන්තර්ජාලයට මුසු කෙරුණි. ත්‍රෛමාසික මෙහෙවරක ප්‍රකාශනයක් ලෙස ඉදිරියේදී අන්තර්ජාලයේ පළ වන ප්‍රාණ අප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සේවය ලබන ඔබ හා අප අතර සුහදශීලී සම්පත්වය තවත් තහවුරු කරමින් මහජන හිතෙෂී රාජ්‍ය සේවාවක් ලබා දීම අපගේ අරමුණ යි. මේ අවස්ථාවට ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු මාණ්ඩලික නිලධාරීන් කාර්යාලයේ සහෝදර නිලධාරීන් මෙන්ම ළමා සමාජ නියෝජනය කරමින් දූ දරුවන් රැසක් සහභාගි විය.

රාජ්‍ය සේවය කියන 'සුදු පිරුවටය' මගේ අතින් කිලිටි වෙලා නෑ

සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් ප්‍රභාත් උදාකර මහතා

ඔහු කොළඹ වෙස්ලි, ගල්කිස්ස ශාන්ත තෝමස් හා කොළඹ ආනන්ද යන විදුහල්වලින් පාසල් අධ්‍යාපනය ලැබුවේය. 1985දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුල් වී රසායන විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධිය හිමි කරගත්තේය. ඔහු රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාභියෙකි. ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලේමාලාභියෙකු මෙන්ම කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිධරයෙකි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර තිහකට ආසන්න අත්දැකීම් ලබා ඇති ඔහු අද සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් ප්‍රභාත් උදාකර මහතායි.

ඔබේ පවුලේ විස්තර ටිකක් කියමුද?

මම උපන්නේ අවිස්සාවේල්ලෙ. එහේ ඉදන් තමයි මම පාසල් යෑම ආරම්භ කළේ. මගේ පියා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙක් හා විදුහල්පතිවරයෙකු ලෙස සේවය කළා. ඔහු ආර්. එච්. සිල්වා. මගේ මව ගුරුවරියක්. ඇය ටී. ඒ. ගුණරත්න. මට වැඩිමහල් සහෝදරියන් දෙදෙනෙක් සහ බාල සහෝදරියන් දෙදෙනෙක් ඉන්නවා.

මම තමයි පවුලේ එකම පිරිමි දරුවා. මගේ වැඩිමහල්ම සහෝදරිය ඉංජිනේරුවරියක්. ඇය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්. දැන් විශ්‍රාමිකයි. අනෙක් සහෝදරියන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්යවරියක්, ශ්‍රී ලංකා ප්‍රම්ති ආයතනයේ අධ්‍යක්ෂවරියක්, කළතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අතිරේක අනුමත රස පරීක්ෂක ලෙසත් රැකියාව කරනවා. මගේ බිරිඳ දිනිෂා රත්නායක. ඇය කැගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) ලෙස සේවය කරනවා. මගේ පුතා කැගල්ල ශාන්ත මරියා විද්‍යාලයේ අධ්‍යාපනය ලබනවා .

ඔබේ මව්පියන් හා සහෝදරියන් රාජ්‍ය සේවයේ සිටින ඉහළ තනතුරු දරන අය. ඔබට අද මේ වගේ තනතුරු දරන්න පවුල් පරිසරයෙන් ලැබුණේ මොනවගේ සහායක්ද?

ඇත්තටම අපේ මව්පියන් අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ නිසා උගත්කමේ ශ්‍රේෂ්ඨත්වයේ වටිනාකම අපට දැනුණා. තමන්ගේ සියලුම මූදල් වැය කළේ අපි පස් දෙනාට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න. ඒ සහාය තමයි අපේ ඉලක්කවලට යන්න දායක වුණේ. මගේ වැඩිමහල් සහෝදරියන් හොඳින් ඉගෙන ගන්න විට ඒ අයගේ සහායත් මට ලැබුණා. ඇත්තටම ඒ මම සහාය ඉතාම කෘතවේදීව සිහිපත් කරන්නේ.

රාජ්‍ය සේවයට එකතු වෙන්න ලැබීම ගැන ඔබට මොකද හිතෙන්නේ?

මම උපාධිය ගත්තට පස්සේ එම පීඨයේම පශ්චාත් උපාධි පර්යේෂණ කටයුතුවල නියැලුණා. ඒ වගේම පීඨයේ ඉගැන්වීම් මෙන්ම බාහිර උපාධි දේශන පැවැත්වීමේ යෙදුණා. මම විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්න කොට පොදුවැඩ කරපු නිසා මගේ දෙමව්පියන්ගේ ආසාවක් තිබුණා මම රාජ්‍ය සේවයට එකතු වෙනවට. එමගින් ජනතාවට සේවයක් කරනවාට. ඇත්තටම මම ඒ ගැන අද සතුටු වෙනවා . මට රැකියාව කරද්දි කළමනාකරණය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාවවගේ විෂයන් රාශියක් සහ ජනතාව සමඟ වැඩකිරීමෙන් ඒවායේ ප්‍රායෝගිකත්වයත් ඉගෙන ගන්න පුළුවන් වුණා. ඒ වගේම රාජ්‍ය සේවය නියමානුකූලව කිරීමෙන් ජනතාවට ලොකු සේවයක් කරන්න හැකියි. ඒ කියන්නෙ රටේ සංවර්ධනයට දායක වෙන ප්‍රතිපත්ති හදන්න දායක වෙන්න පුළුවන්. නිශ්චිත ඉලක්කවලට ජනතාව පොළඹවගෙන ගෙන යමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්න පුළුවන්. රටක සංවර්ධනයේ ප්‍රධානතම දැකිරෝදය කමයි රාජ්‍ය සේවය. අපට විශ්‍රාම ගියත් කළ සේවය මතක් කරලා සතුටු වෙන්න පුළුවන් .

ඔබ දරපු තනතුරු අතරින් කැමතිම තනතුර මොකක්ද?

මට පරිපාලනයේ සෑම ක්ෂේත්‍රයකම ඒ කියන්නෙ, රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය පාලනය හා දිස්ත්‍රික් පාලනය සහ පළාත් සභා යන සියල්ලෙම රාජකාරී කරන්න ලැබුනා. මෙම සියළු තනතුරුවලට මා කැමති නමුත් ඒ අතරින් රාජ්‍ය සේවයේ මගේ වඩාත්ම කැමති වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් ධූරය දරපු කාලයටයි.

ඒ ඇයි?

ඇත්තටම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් කියන්නේ විශ්ව විද්‍යාලයක්. සියලුම විෂයන් එකතු වෙලා තියෙනවා. ඒවගේම සෘජුවම ජනතාව එක්ක ගැටෙන, ඒ අයගේ දුක සතුට දැනෙන, ස්වාධීනව නිර්මාණශීලීව වැඩ කරන්න පුළුවන් තනතුරක් තමයි ප්‍රාදේශීය ලේකම් තනතුර. ඒ වගේම එහිදී ඉතාම සුහද දක්ෂ අවංක නිලධාරීන් පිරිසක් කිසිදු ලාභ අපේක්ෂාවකින් තොරව මගෙ සහායට නිරන්තරව සිටියා. වරකාපොල දදිගම කියන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩිම ජනගහනයක් ජීවත්වෙන ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය. එහි වසම 78 ම ජංගම සේවා සියලු ආයතන නිලධාරීන් හා දේශපාලන අධිකාරියන් එකතු කරගෙන ක්‍රමවත්ව කෙටි කාලයක් තුළ විශාල සේවයක් කරන්න ලැබුණා. සියලුදෙනාගේ කැපවීම සහයෝගය ලැබුණා. සෑම ජංගම සේවා දිනකම පෙ.ව. 7.30 ට පිටත් වෙලා 8.30 ට නියමිත වේලාවේදී සියලු රාජ්‍ය අර්ධරාජ්‍ය සේවා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුවා.ඒසඳහා රජයේ කිසිදු මූදලක් ප්‍රතිපාදනයක් යොදාගත්තේ නැහැ.අවසානයේ ඊට සහභාගිවූ සියලු නිලධාරීන්ට වෛද්‍යදන්ත ආයුර්වේද සායනයක් නිලධාරීන් 700 ට පැවැත්වුවා. ඒ වගේ කටයුතු සිහිපත් වෙන විටත් සතුටුයි. ඒ වගේම ජනපදවලට ගිහින් ඔප්පු නැති ඉඩම්වලට ගිහින් මිනිස්සුන්ට ඔප්පු හදලා දුන්නා. ඉඩම් ප්‍රශ්න විසඳලා දුන්නා. ඒ මිනිස්සුන්ට ඒක ලොකු සහනයක් වුණා. කියන්න ගියොත් ඉවර කරන්න බැහැ. මට වැඩ කරන්න ඒ කාලේ හිටපු නිලධාරීන් ලොකු සහයක් දුන්නා. මට මතකයි කැගල්ල පැවැත් වූ එක් වැඩසටහනකට අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කෑම පාර්සල් 2500 ක් භාර දීලා තිබුණා. ඒ වෙලාවේ වසම්වල නිලධාරීන්ගේ ලැබුණු සහායක් උපරිමයි. පරිපාලන නිලධාරියෙක් විදියට මම කරන්න මෙහෙයවන එක. අනෙක් සියලුම බර කරට ගන්නේ නිලධාරීන්. ආපස්සට හැරිලා බලන කොට ඒ කාලය හරිම සුන්දර මතකයක්.

මම කැමතිම වරකාපොළ ප්‍රාදේශීය ලේකම් වෙලා හිටපු කාලෙට

ඒ කාලේ ලබපු ජයග්‍රහණ තියෙනවා නේද?

2012 වසරේ රාජ්‍ය කලමණාකරණ කරගයේ කෑගලු දිස්ත්‍රික්කයෙන් දෙවන ස්ථානය ලබා ගත්තා. 2013 ජාතික ඵලදායිතා කරගයේ විශිෂ්ඨ කුසලතා සහතිකය සහ 2015 ජාතික ඵලදායිතා කරගයේ දිවයිනේ දෙවන ස්ථානයත් සබරගමු පළාතේ පළවැනි ස්ථානයත් දිනා ගත්තා.

වෘත්තීය ජීවිතේ අභියෝගයක් වුණු අවස්ථා මොනවද?

මම කැගල්ල දිස්ත්‍රික්කයේ අතිරේක දිස්ත්‍රික් ඛනතුර භාර අරගෙන ඉන්න සුළු කාලෙකින් බුලත්කොහුපිටිය හා අරණායක ප්‍රදේශවල විශාල නායයෑම් සිදු වුණා. මහා අනාර්ථ වැස්සකට මැදි වෙලා බුලත්කොහුපිටියේ වතු නිවාස සංකීර්ණයේ නාය යෑමට හසු වෙලා 17 දෙනෙක් අතුරුදහන් වුණා. දිසාපතිතුමාගේ උපදෙස් පරිදි එහි රාජකාරී කර සවස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඒ පිළිබඳව සාකච්ඡා කරමින් ඉන්න විට අරණායක සාමසර කන්ද නාය යාම නිසා එම ගම ම නාය යන බව දැනගන්නට ලැබුණා. අපට ඒ දැනුම් දුන්නු නිලධාරියාත් ඒ නාය යෑමට හසු වෙලා මිය ගියා. එය ඇත්තටම කණගාටුදායක මතකයක් මට. ඒ එක්කම ජනතාව සංවිධානය වෙලා ආධාර ආහාර ද්‍රව්‍ය අපට රටේ හැම තැනින්ම තොග පිටින් ලැබෙන්න පටන් ගත්තා. මුලින්ම ඒවා ඔක්කොම අපි ගබඩා කළේ කෑගල්ල නගර ශාලාවෙ. නගර ශාලාව තුළ ඉන්න ඉහලටම භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය ගොඩ ගහලා. ඒ අතරතුර එවක ජනාධිපතිතුමා දන්වලා තිබුණා එතුමා කැගල්ලට එනවා දින 3කින් සාකච්ඡාවක් සංවිධානය කරන්න කියලා. මට දිසාපතිතුමා කතා කරලා කිව්වා කොහොමහරි නගර ශාලාව තමා එම සාකච්ඡාව පවත්වන ස්ථානය ලෙස තෝරගෙන තියෙන්නෙ ඒක හිස් කරන්න ඕනේ. එතන ගබඩා කරලා තියෙන ආධාර ද්‍රව්‍ය වෙන ස්ථානයක ගබඩා කරන්න ලැහැස්ති කරන්න කියලා. ඒ වෙලාවේ ලැබෙමින් තිබෙන මෙම ආධාර රැස්කරගන්න ලොකු ආරක්ෂිත භාවිතයට ගනිමින් පැවතුන ගබඩාවක් නගරයෙ තිබුනෙ නැහැ. පසුව ටිකක් දුරින් පරගම්මන ප්‍රදේශයේ ඒවන විට භාවිතයට නොගන්නා කැලෑවෙන් වැසී තිබූ ගොඩනැගිලි සංකීර්ණයක් ඒ සඳහා යොදාගන්න අප තීරණය කලා. බන්ධනාගාර රැඳවියන් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගෙන්වගෙන මේ ආධාර එම ගොඩනැගිලිවලට ගෙනියන්න සැලසුම් කළා. ඒවා ලොරිවලට පටවන්න ඕනෑ. බාගන්න ඕනේ. එතන ටොන් ගාණක බරට ආධාර පිරිලා තිබුණා. ඒ වගේම ලංකාවේ හතර වටෙන්ම තවත් ආධාර ලැබෙමින් පැවතුනා. ඒ අතින් ලංකාවේ මිනිස්සු හරිම පරිත්‍යාගශීලි අය. ඉතිං හැම පළාතකින්ම එන ආධාර බඩු පුරෝලා ලොරි ආවා. ඒ වෙලාවෙ 30ක පමණ පිරිසකගෙන් එම ස්ථානය සුදුසු ලෙස සකස්කරගෙන ගබඩා කර ගන්න වෙලාව මදි. මම ඒ වෙලාවේ හිටපු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කතා කරලා එම නිලධාරීන්ගෙ සහාය ඉල්ලුවා. ඇත්තටම එම නිලධාරීන් බස් පිටින් ඇවිත් අපට උදව් කළා. ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් වගේම කාර්යාල නිලධාරීන් ස්වේච්ඡාවෙන් ආවා. ඒ එකමුතුකම ගැන මට හරි ආඩම්බරයි. අපට දවස් තුනෙන් රාත්‍රියෙත් වැඩකරලා නගර ශාලාව පිරිසිදු කරලා රැස්වීමත් සාර්ථකව පවත්වන්නට අවස්ථාව සැලසුවා.

ඔහු බෙහෙක් දැරූ තනතුරු

- සහකාර ලේකම් - කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
- සහකාර ලේකම් - උසස් අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය
- සහකාර අධ්‍යක්ෂ - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම් - වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- අතිරේක දිස්ත්‍රික් ලේකම් - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - සබරගමුව පළාත් සභාව
- ආණ්ඩුකාර ලේකම් - සබරගමුව පළාත් සභාව
- ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් - සබරගමුව පළාත් සභාව

තනතුරට වඩා වැදගත් මගේ අතින් රටට වෙන සේවයයි

බොහෝ අයගේ අදහස රාජ්‍ය සේවය අකාර්යක්ෂම පිං පඩි ගන්න සේවාලාභීන්ට අකාරුණිකව සලකන සේවාවක් කියලා. ඔබ මේ ගැන මොකද කියන්නේ?

කලාතුරකින් සිදුවූ සිද්ධියක් සමහර සමාජ මාධ්‍යවලින් හුවා දක්වන ආකාරය නිසා ඒ වගේ අදහස් ජනතාව විශ්වාස කරන්නේ. රාජ්‍ය සේවය තමයි රටක සංවර්ධනයේ කේන්ද්‍රය. අනිත් හැම දෙයක්ම ඒ වටේට එකතු වෙලා තියෙන්නේ. විධායකය ව්‍යවස්ථාදායකය එක්ක කෙළින්ම සම්බන්ධ වෙන්නේ රාජ්‍ය නිලධාරීන්. සාධාරණව,විනිවිදභාවීත් යුතුව විනයගරුකව,කෘත්‍රිමත්වයෙන් හැකි ඉක්මනින් අප රාජකාරී ඉටුකරන්න ඕනෙ ඒ නිසයි. පූද්ගලික අංශය වගේම රාජ්‍ය නොවන සංවිධාන එකතු කරගෙන මහජනතාවට සේවය කරන්නේ රාජ්‍ය නිලධාරීන්.පසුගිය කොරෝනා වසංගතය කාලේ රාජ්‍ය නිලධාරීන් කොයිතරම් ප්‍රසංසනීය විදියටද තමන්ගේ සේවය ලබා දුන්නේ.

රාජ්‍ය සේවයට එකතු වෙන නවක නිලධාරියෙකුට කියන්න ඔබට තියෙන්නේ මොනවගේ අදහසක්ද?

අපි වැටුප් ගන්නේ ජනතාවගේ බදු මුදල්වලින්. රාජ්‍ය සේවයේ මොන තනතුර දැරුවත් ඒ තනතුරෙන් රටට සේවය සැලසීමට අප උපරිමව කැපවිය යුතුයි. රටේ මොන ප්‍රතිපත්තිය හැදුවත් ජනතාව අතරට ගෙනියන්නේ රාජ්‍ය නිලධාරීන්. ඒ අය තමයි මොන කර්කෂ තීරණයක් වුණත් ලස්සන කරලා වර්ණවත් කරලා ජනතාවට දෙන්නේ. ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න උදව් කරන්න පුළුවන් රාජ්‍ය නිලධාරියාට. ඇත්තටම අපි හරි සේවාවක් ලබා දුන්නොත් ජනතාව සමෘද්ධිමත් කරලා මේ රට පත්වෙලා තියෙන ආශාධයෙත් ගොඩ ගන්න හැකියි. ඒ තෘප්තිය පූද්ගලික අංශයට එකතු වෙලා ගන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ.

ඔබේ රැළඟ බලාපොරොත්තුව මොකක්ද?

රාජ්‍ය සේවය කියන්නේ සුදු පිරුවටයක්. අපට දීලා තියෙන ඒ සුදු පිරුවටය වංචා කරලා, දූෂණ හොර මැරකම්වලට උදව් කරලා, දූවිලි ගාලා අපවිත්‍ර කරලා අපට ගෙදර ගිහින් කවදාවත් සතුටින් ජීවත් වෙන්න බැහැ. මට දීලා තියෙන සුදු පිරුවටයේ තිබුණු දූවිලි කුණුත් මකලා දූන්නටත් වඩා හොඳට පිරිසිදු කරලා ආපහු දීලා යන්න පුළුවන්නම් එයින් කෘත්‍රිමත් වෙන්න පුළුවන්. ඒක නිසා ඉදිරි කාලයේදී වුනත් ලැබෙන කුමන තනතුරකින් වුනත් ජනතා හිත සුව පිණිස කැපවීමෙන් ප්‍රතිපත්තිගරුකව රාජකාරිය කිරීමයි බලාපොරොත්තුව.

සටහන - චලානි හේරත්

අපේ මෙගෙවර්ස

අඹිපුස්ස පුරන් කුඹුරුවල කැකුණු විගාවක්

පවතින ආර්ථික අර්බුද හමුවේ අමතර ආදායමක් හා ස්වයං රැකියා අවස්ථා ඇති කිරීමේ අරමුණින් කඳුනාගත් පුරන් වූ කුඹුරුවල කන්කුන් වගා කිරීම සඳහා ගම්වාසීන් යොමු කිරීම වසමේ නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් සිදුකෙරිණි

ඉටි පන්දම් හා බයිට් නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහනක්

ස්වයං රැකියා අවස්ථා උදාකර දීමේ අරමුණින් ඉටි පන්දම් හා බයිට් නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහනක් තාඹුගල වසමේ ප්‍රජා සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේදී පැවැත්විය.

දුරියන් වගාවට පුහුණු වැඩසටහනක්

දුරියන් වගාව නගා සිටුවීමේ අරමුණින් ටයිටොප් වෙරා රෝගය හා අස්වැන්න වැඩි කරගැනීමේ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පසුගියදා පැණිහෙල වසමේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් කැගල්ල කෘෂි කාර්මික නිලධාරී හා කෘෂි උපදේශක යන නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් පැවැත්විය.

ප්‍රජා සංවර්ධන වැඩසටහනක් මදුරුපිටියේදී

ඵලදායිතා සංකල්පයයටතේ මනාකළමනාකරණයකින් යුත් පවුලක් ගොඩනැගීමේ අරමුණින් සුපිළිසර නිවසක් තේමාව ඔස්සේ ප්‍රජා සංවර්ධන වැඩසටහනක් මදුරුපිටිය වසමේදී පසුගියදා පැවැත්විය.

අල්ගම කලාපයේ දරුවන්ට විවිධ ප්‍රසංගයක්

අල්ගම කලාපයේ සියලුම වසම්වල ළමා සමාජවල දරුවන්ගේ දක්ෂතා හා කුසලතා ඔප් නැංවීමේ අරමුණින් වසම්වල සියලුම නිලධාරීන්ගේ එකමුතුවෙන් විවිධ ප්‍රසංගයක් පසුගියදා පැවැත්විය. සියලුම ප්‍රතිපාදන සමෘද්ධි බැංකුවෙනි.

අල්පිටියට ගොවි කාන්තා සමිතියක්

ගොවි කාන්තාවන් නගා සිටුවීමේ අරමුණින් ගොවි කාන්තා සමිතියක් පසුගියදා අල්පිටිය වසමේදී පිහිටුවිය. එහිදී ගොවි කාන්තාවන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා කාන්තා එකමුතුව ඇති කරමින් කාන්තා සහයෝගිතාව වර්ධනය මෙන්ම කාන්තාවන්ගේ ආර්ථිකය නගා සිටුවීම අරමුණු වේ.

අඩු මිලට සබන් නිෂ්පාදනයට උපදෙස්

වෙළඳපොල සබන් මිල ඉහළ යාම නිසා ජනතාවට ආර්ථික සහනයක් ගෙන දීම සඳහා ඉතා අඩු මුදලට සබන් නිෂ්පාදනය කරගන්නා ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහනක් වසමේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් පසුගියදා එළිපත්තගුව වසමේදී පැවැත්විය.

නිවටුවේ ඩෙංගු මර්ධන ශ්‍රමදානයක්

ඩෙංගු උවදුර පිටු දැකීමේ අරමුණින් නිවටුව මහා විද්‍යාලයේ ශ්‍රමදානයක් පාසලේ ගුරුවරුන්, මව්පියන් ,දරුවන් හා ඒකව වසමේ නිලධාරීන් විසින් දියත් කෙරිණි. ඊට සමගාමීව නිවටුව ශ්‍රී සුමේධාරාමයේ ඩෙංගු ශ්‍රමදානයක් දායක සභාව, ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයින්ගේ දායකත්වයෙන් සිදු කෙරිය.

මල්මඩුවට විශේෂ ආයුර්වේද සායනයක්

නිරෝගීමත් ජන සමාජයක් බිහි කිරීමේ අරමුණින් විශේෂ ආයුර්වේද සායනයක් මල්මඩුව ප්‍රජා ශාලාවේදී පසුගියදා පැවැත්විය. ඒ සඳහා මූලිකත්වය වැඩිහිටි සමිතියේ නිලධාරීන් හා සාමාජික පිරිස ආයුර්වේද වෛද්‍ය නිලධාරී හා වසමේ නිලධාරීන්ගෙනි.

අපදාවට පෙර සුදානමක් ඕපාත දී

අපදාවට පෙර සුදානම යටතේ ආපදාවකදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ඔපාත වසමේ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් වැදිකන්ද සමිති ශාලාවේදී විශේෂ ආපදා කළමනාකරණ වැඩසටහනක් පැවැත්විය.

මී අපේ මෙහෙවර

දෙල්ගමුව වසමේ පසුගියදා රුක් රෝපණ වැඩසටහනට සමගාමීව පන්සල් භූමියේ පැල සිටුවීමක්

ආදේශක ආහාර හඳුන්වාදීම හා ගම්වාසීන්ගේ ආර්ථිකය නගා සිටුවීමේ අරමුණින් කෙසෙල් වලින් බයිට් සෑදීමේ වැඩසටහනක් හපුගොඩ ප්‍රජා ශාලාවේදී

හල්ලව වසමේ පදිංචි ආබාධිත අයකුගේ නිවස සුද්ද පවිත්‍ර කර දීම වසමේ නිලධාරීන් හා අසල්වැසියන්ගේ දායකත්වයෙන්

අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පොත් බෙදා දීමේ වැඩසටහනක් කලුගල ග්‍රාම නිලධාරී කාර්යාලයේදී

අක්වත්ත
ග්‍රාම සංවර්ධන සමිතියේ හා වසමේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් දරුවන්ට චිත්‍ර තරගයක්

තුංතොට වසමේ දරුවන්ගේ ළමා චිත්‍ර තරගයක් හේරත්ගොඩ සමිති ශාලාවේදී

ගෙවතු වගාකරුවන් නගා සිටුවීමේ අරමුණින් ඉඹුලෝවිට වසමේ පුවක්, ගොරකා, කෝපි පැල බෙදාදීමක්

එළමල්දෙනිය වසමේ දහම් පාසල් දරුවන් සමග එක්ව පාසල් ගොඩනැගිල්ල අවට ශ්‍රමදානයක්

ව්‍යවසායකයින් දිරි ගැන්වීමේ අරමුණින් ගොඩවෙල, පුහුල්ගම හා තාඹුගල වසම්වල ව්‍යවසායක පොළ ගොඩවෙල හංදිය අසලදී

රාගල්කන්ද සිගිති පෙර පාසලේ දූ දරුවන්ට පෝෂදායී ආහාර වේලක්

දරුවන්ගේ පෝෂණ මට්ටම වැඩි කිරීම හා පෝෂදායී ආහාර හඳුන්වා දීමේ අරමුණින් මැණික්කඩවර පාසලේ දරුවන්ට පෝෂදායී සමබර ආහාර වේලක් වසමේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන්

ආහාර සුරක්ෂිතතා සහ සබන් නිෂ්පාදනය පිළිබඳ වැඩසටහනක් කෝදාපාළුව වසමේදී

ළමා නායකත්ව පුහුණු වැඩසටහනක් යද්දෙහිමුල්ල වසමේදී

මැදගොඩ ශ්‍රී බෝධිරාජාරාමය යළි පිළිසකර කෙරේ

ගණිතපුර වසමේ විහාර වෙමින් පවතින ගමේ කේන්ද්‍රය වන මැදගොඩ ශ්‍රී බෝධිරාජාරාමය පිළිසකර කර නැවත ගම්වාසීන් වෙත ලබා දීමේ අරමුණින් එහි නවීකරණ කටයුතු අඹගල විහාරාධිපති රුජුපේ ධම්මිනිද නිමියන්ගේ මූලිකත්වයෙන් පසුගියදා සිදු කෙරිණි.

පහළ ලෙනගල මහා සල්පිලක්

අවස්ථානෝචිත සංවර්ධන ප්‍රවේශය උපයෝගී කරගනිමින් ග්‍රාමීය සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා ස්වයං රැකියාවල නිරත වූවන්ගේ ගම්වාසීන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් පහළ ලෙනගල වසමේ ආර්ථික සංවර්ධන නිලධාරී විසින් පිහිටුවා ක්‍රියාත්මක වන ශ්‍රම ශක්ති සංගමයට ආධාර පිණිස මහා සල්පිලක් පසුගියදා ලෙනගල රජමහා විහාරස්ථානයේදී පැවැත්විය. ප්‍රාදේශීය ලේකම්තුමා හා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියගේ උපදේශකත්වයෙන් හා මගපෙන්වීමද වසමේ නිලධාරීන්ගේ සහයෝගයෙන් හා ශක්තියද ඒ සඳහා ලැබිණි.

ග්‍රාමීය සහජීවන සංගමයක් කුඹල්ගමදී

පවුල්වල ආර්ථික අර්බුදය නිසා ගැටලු ඇතිවීමේ ප්‍රවනතාවය පිළිබඳ දැනුවත් කිරීම සහ ස්වයං රැකියා හඳුන්වාදී ආර්ථික ගැටලුව විසඳුම් සෙවීමේ අරමුණු පෙරදැරිව ග්‍රාමීය සහජීවන සංගමයක් පිහිටවීම හා කාන්තා සමිතියක් පිහිටවීම කුඹල්ගම වසමෙදී සිදුවිය. අධිකරණ අමාත්‍යාංශයේ ජාතික ඒකාබද්ධ අංශය නියෝජනයකරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ විෂය භාර නිලධාරී ගයානි මහත්මියගේ ප්‍රධානත්වයෙන් හා ග්‍රාම නිලධාරී තුමියගෙ සහ ආර්ථික සංවර්ධන නිලධාරී තුමිය සහ සංවර්ධන නිලධාරී තුමාගේ සහභාගිත්වයෙන් සංවිධානය කරිණි

විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට රැකියාවක්

විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ලෝක සංඥා භාෂා දිනය නිමිත්තෙන් පසුගියදා විශේෂ වැඩසටහනක් මාස් තුරුලි ආයතනය අනුග්‍රහයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේද පැවැත්විණි. එහිදී වරකාපොල කොට්ඨාසයේ රැකියාගත කළ හැකි හැකි හා රැකියා ගත කළ විශේෂ අවශ්‍යතා සහිත තරුණ තරුණියන් රැසක් සහභාගි වූ මේ වැඩසටහන ප්‍රාදේශීය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් මානව සංවර්ධන නිලධාරීන්ගේ සංවිධානයෙන් හා විශේෂඥ මනෝ වෛද්‍ය සුලීහා පෙරේරා මහත්මියගේ දායකත්වයෙන් පැවැත්වුණි.

වරකාපොල වසමේ සාර්ථකව පැවැති දින හයක බතික් පුහුණු වැඩසටහන

දිරිය වයවසායකයන්ගේ අලෙවි පොළ මාස් තුරුලි ආයතන පරිශ්‍රයේදී

2වරකාපොල කොට්ඨාසයේ ව්‍යවසායකයන්ගේ ආර්ථිකය නංවාලීමේ අරමුණින් මාස් තුරුලි ආයතන පරිශ්‍රයේදී පැවැති විශේෂ අලෙවි පොළ ඉතා සාර්ථකව දෙදිනක් පුරා පැවැත්විණි. ප්‍රාදේශීය ලේකම්තුමාගේ මග පෙන්වීම, අප කාර්යාලයේ මානව සම්පත් නිලධාරී චන්ද්‍රානි වීරවර්ධන මහත්මියගේ සම්බන්ධීකරණය හා මාස් තුරුලි ආයතනයේ නිලධාරීන්ගේ සහාය මෙන්ම දිරිය ව්‍යවසායකයන්ගේ උත්සාහය ඒ සාර්ථකත්වය පිටුපස තිබේ.

ගෘහස්ථ ඵලදායීතාව පිළිබඳ වැඩසටහනක් සහ සබන් පුහුණු වැඩසටහනක් ගොඩවෙල වසමේ ද පවත්වනලදී

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ සුවතාව සඳහා "ගී රසභරස"

සංගීත රසාස්වාදනය සුවබර, යහපත්, නිරවුල් මානසිකත්වයක රහසය. එදිනෙදා රැකියාවේ හා පුද්ගලික ජීවිතයේ කාර්යබහුලත්වයෙන් සිටින වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ විඩාපත් මනසේ ආතතිය අඩු කර මානසික සුවතාවයක් ඇති කිරීමේ අරමුණින් සොඳුරු සංගීතාත්මක දෙහෝරාවක් වූ 'ගී රසභර' විචාරාත්මක ගී සැදෑව පසුගියදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විය. ප්‍රාදේශීය ලේකම්තුමාගේ සංකල්පයකට අනුව සංවිධානය වූ එතුමාගේ ගීතාර්ථයෙන් චර්ණවත් වූ ඒ මොහොත සාර්ථක අන්දමින් ෆේස්බුක් සජීව විකාෂණයක් ද සිදු කෙරිය. දඩිගම ආර්ථික සංවර්ධන නිලධාරී රුවන් සංජීව වික්‍රමසිංහගේ නිවේදනයෙන්ද සංස්කෘතික අංශයේ මනේෂ් අමරකෝන් මහතාගේ හා දිනුෂා ආරියරත්න මහත්මියගේ ගීතවත් හඬින් ආදරය, විරහව, මනුසත්බව සුසංයෝග කර සංවේදී හඳවන් විවර කළ සොඳුරු සංගීතාත්මක සුයාමය තවත් හැඩ විය.

වරකාපොල පාසල් දරුවන්ට ඔටෝ ග්ලාන්ස් මෙතින් පාසල් උපකරණ

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධි හා අඩු ආදායම්ලාභී දරුවන් වෙනුවෙන් වටිනා පාසල් උපකරණ කට්ටලයක් ලබා දීමේ විශේෂ වැඩසටහනක් පසුගියදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විය. ප්‍රාදේශීය ලේකම්තුමාගේ හා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියගේ මූලිකත්වයෙන් වරකාපොල සමෘද්ධි කලාපයේ නංගල්ල වසමේ සමෘද්ධි නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් හා 'ඔටෝ ග්ලාන්ස්' ආයතනයේ මූලාෘ අනුග්‍රහයෙන් සංවිධානය වූ මේ වැඩසටහනට සබරගමු පළාත් ආණ්ඩුකාර ලේකම්තුමා හා ඔටෝ ග්ලාන්ස් ආයතනයේ අධිපතිතුමන් ඇතුළු කාර්ය මණ්ඩලය සහභාගි විය. එහිදී යහපත් අනාගත පරපුරක් උදෙසා පැමිණ සිටි ළ දරුවන්ට වටිනා දේශනයක් සබරගමු පළාත් ආණ්ඩුකාර ලේකම් ප්‍රභාත් උදාකර මහතා විසින් පැවැත්විය.

විරුකියවට විසඳුමක් - වරකාපොළට රැකියා චෙළෙඳපොළක්

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව එක්ව සංවිධාන කළ ප්‍රාදේශීය රැකියා පොළ පසුගියදා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී සාර්ථක අන්දමින් පැවැත්විය. මෙයට රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් හාරසීයක් පමණ සහභාගී වූ අතර ඒ සඳහා රැකියා ආයතන, ප්‍රහුණු ආයතන, අධ්‍යාපන ආයතන, විදේශ සේවා නියෝජිත ආයතන, රක්ෂණ ආයතන හා ශ්‍රී ලංකා යුධ හමුදාව සහභාගි විය.

ආර්ථික අපහසුතා පවතින මෙවැනි කාලයක ප්‍රාදේශීය ලේකම්තුමාගේ උපදෙස් හා මාර්ගෝපදේශකත්වය පරිදි කාර්යාලයේ මානව සම්පත් නිලධාරීන් දෙපළ සංවිධානය කළ මේ අවස්ථාවට සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය, ගණකාධිකාරී තුමිය, සහකාර අධ්‍යක්ෂකතුමන් හා පරිපාලන ග්‍රාම නිලධාරී සහභාගි විය.

තෝලංගමුව මැදි විදුහලේ සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක්

විශේෂ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනක් තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලයේ ද දරුවන් සඳහා පසුගියදා සාර්ථක අන්දමින් පැවැත්විය. වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් කාර්යාලයේ මානව සම්පත් නිලධාරීන්ගේ සංවිධානයෙන් පැවැත් වූ මේ වැඩසටහනට ප්‍රාදේශීය ලේකම්තුමා, පාසලේ විදුහල්පතිතුමා ,කැගල්ල දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී රංජිත් මුතුණුවල හා මානව සම්පත් නිලධාරී ඉදුනිල් ජයවීර යන සහභාගි විය.

දිනුම් කණුව

මනස සහ මොළය අතර හුදකලා වීමට.



සෑම දුෂ්කරතාවක්ම මැද
අවස්ථාවක් තිබේ.
-ඇල්බට් අයින්ස්ටයින්-

විශිෂ්ඨ කාර්යයක් කිරීමට ඇති එකම මාර්ගය
ඔබ කරන දෙයට ආදරය කිරීමයි.
-ස්ටීව් ජොබ්ස්-

අනාගතය පුරෝකථනය කිරීමට හොඳම ක්‍රමය
එය නිර්මාණය කිරීමයි.
-පීටර් ඩ්‍රකර්-

වෙනත් ඉලක්කයක් තැබීමට හෝ නව සිහිනයක් දැකීමට
ඔබ කිසි විටෙකත් වයසින් වැඩි නොවේ.
-සී.එස්. ලුවිස්-

සාර්ථකත්වය අවසාන නොවේ, අසාර්ථකත්වය මාරාන්තික නොවේ
එය වැදගත් වන්නේ ඉදිරියට යාමට අයහෝ ධෛර්යය ලබාගැනීමටය.,
-වින්ස්ටන් චර්චිල්-

,ඔබ වීමට නියමිත එකම පුද්ගලයා ඔබ වීමට තීරණය කරන පුද්ගලයා වේ.
-රැල්ෆ් වෝල්ඩෝ එමර්සන්-



ජීවත්වීමේ ශ්‍රේෂ්ඨතම මහිමය ඇත්තේ කිසිදා නොවැටී සිටීම තුළ නොව,
අප වැටෙන සෑම අවස්ථාවකදීම නැඟී සිටීම තුළයි.
-නෙල්සන් මැන්ඩෙලා-

මාස් - තුරුලියෙන් උසස් අධ්‍යාපනය ලබන සිසුන්ට පරිත්‍යාග රැසක්

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව වරකාපොල කොට්ඨාසයේ වසම 30 ක් ආවරණය වන පරිදි උසස් අධ්‍යාපනය ලබන පාසල් සිසුන් තිහකට රු150000 ක් වටිනා පාසල් උපකරණ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පසුගියදා බෙදා දෙනු ලැබිණි. මාස් තුරුලිය ආයතනයේ මූල්‍ය අනුග්‍රහයෙන් පැවැති මේ වැඩසටහන කාර්යාලයේ මානව සම්පත් නිලධාරීන් විසින් සංවිධානය කර තිබුණි.

MAS

මත් උවදුර නසන්න මග කියන 'අන්දෝරිස්ගේ සුරලොව' පාසල් නුනකට යයි

පසුගිය ජූනි 26 දිනට යෙදී තිබූ ලෝක මත් ද්‍රව්‍ය නිවාරණ දිනය නිමිති කරගෙන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මග පෙන්වීම මත කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සංවිධානය කරනු ලැබූ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සඳහා වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ උපදෙස් පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නිර්මාණය කර ඉදිරිපත් කරන ලද අන්දෝරිස්ගේ සුරලොව චිඩි නාට්‍යය කෑගල්ල ශාන්ත මරියා දෙමළ මහා විද්‍යාලය, මොලගොඩ ජයපාල මහා විද්‍යාලයේ හා කෑගලු බාලිකා මහා විද්‍යාලය දර්ශන වාර තුනකදී ප්‍රදර්ශනය කෙරිය.

ශ්‍රී ලංකා හදබිම අධිකාරියෙන් ගෙවතු වගාවට අත හිත

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලෙනගල වසමේ සිදු කළ ගෙවතු වගා කරනු ලබන ගෙවතු වගා වැඩසටහන වෙනුවෙන් ප්‍රතිලාභීන් හැත්තෑ පස් දෙනකු සඳහා බටු, තක්කාලි, අමු මිරිස්, මාලු මිරිස් , නයි මිරිස් පැළ කට්ටලයක් හා කාබනික දියර පොහොර ලීටර 2 බැගින් පසුගියදා බෙදා දුනි.

සත්ව හානි වැළැක්වීමට නියමු ව්‍යාපෘතියක්

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සම්පත් දායකත්වයෙන් වරකාපොල ප්‍රාදේශීය කොට්ඨාසයේ පහළ ලෙනගල ග්‍රාම නිලධාරී වසමේ සත්ව හානිය වළක්වාලීමට ක්‍රියාත්මක කිරීමට නියමිත නියමු ව්‍යාපෘතිය පිළිබඳ රැස්වීමක් පසුගියදා පහළ ලෙනගල රජමහා විහාරස්ථානයේදී පැවැත්විය. ඊට සමගාමීව කාබනික පොහොර නිෂ්පාදිත පොහොර ලබා දීම, ගෙවතු වගා ප්‍රතිලාභීන් සඳහා උපකරණ බෙදා දීම හා පාංශු සංරක්ෂණ චෙක්පත් බෙදා දීම සිදු කෙරුණි. මේ සඳහා ප්‍රාදේශීය ලේකම්තුමන්ගේ ප්‍රමුඛත්වයෙන් සැලසුම් කළ අතර ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමන් ඇතුළු නිලධාරීන් රැසක් මෙන්ම කෑගල්ල දිස්ත්‍රික් ලෙකම් කාර්යාලය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, දිසා වන නිලධාරී හා පශු වෛද්‍ය නිලධාරී යන සහභාගි විය. මේ වැඩසටහන සංවිධානය, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම කටයුතු කලාප නිලධාරී අතුල සෙනවිරත්න ද ඒකක කළමනාකරු දිලිනි ලංකාපති ද ආර්ථික සංවර්ධන නිලධාරී ඉදුනිල් සේනානායක ඇතුළු වසමේ නිලධාරීන් ද ග්‍රම ශක්ති සංගමයේ නිලධාරීන් හා සාමාජිකයින් විසින් සිදු කරන ලදී.

සාදිකන්නිකා

දැදිගම හන්දියට හිරුවටත් කලින් වගේ
සාදිබණ්ඩා එනවා සිරිතකට වගේ
පටාවකුත් හිසමත උරුමයක් වගේ
මුල් පත්වීමෙ දැදිගම මහකයකි. මගේ

දින කිහිපයක් කන්තෝරුව වෙත ආවා
ගරාවැටිලා වැසිකිළියත් නෑ කීවා
එදවස ගමේ මම්පියොා හරැසරු ලැබුවා
වයසයි මටත්, මලයට හැට පහ ලැබුවා

වැඩිහිට දීමනාවක් පම ණයි තිබුනේ
සමෘද්ධියත් නාගිගෙ නම ටයි වැට්ටුනේ
මාසෙන් දවස් දෙක තුනකුයි අත හැරුයනේ
ඒ දෙක තුනත් කඟවයි හකුරුයි තිබුනේ

පොල්කට්ටක උඩ ඉටිපන්දම රඳවා
විදුලිය නොමැත නිවෙස් රෑ හත කෙරුවා
ලී පෙට්ටියක පමණක් මුල්ලක දුටුවා
එහි පොත් පත්ය ධනයක් සේ මුර කෙරුවා

වසම නිලදරුවො එක්වී වැඩ නිම කෙරුවා
නවවැසිකිළියෙ නැහැ අඩියක්වත් තියලා
දැරවය අතේ පුදුමයි ඉදිරිය මරුවා
සාදිබණ්ඩා දිවිගමනම නිම කෙරුවා

අදටත් මගේ කාර්යාලයේ කොනක රැකී
ඉටිඵණුවෙලා පොල්කටුවක් දකිනු හැකී
සිහිවටනයි අපි හැමටම පැතුව හැකී
සාදිබණ්ඩා මතු සසරෙ දී නිවන් දකී

රුවන් එස්. වික්‍රමසිංහ
සංවර්ධන නිලධාරී

අනාරා වැකි මැද නිවීගිය යෑම වෙඩියා මලක සුළු ශ්‍රාද්ධය

හිමිදිරියෙ නිදාගමන් ඇවටෙද්දි මගේ එක
හිතුණෙ නම් හැකිලෙන්න ඉරු රැල් වැටෙන තුරුම
සුළඟ රැඳි කිණිසලා මුව කමල ඝිනින විට
නොදැනීම සැරවුනා මගේ රොන් හිරු දෙසට...

මෙකරම් හැඟුම්බර වෙඩියා මල් ගොන්න
අසුරු කර ගිරු මොක්ෂද සැඟව ගියෙ එක වරම
මැහි දුනයන් විලඟ ලිහිනියන් ආ හිඟෙ
කාටනම් කියන්නද මගේ බය වැඩි හොඳට...

අසුරු කරලා වටම පාඹිගියා කළු වලා
හිතුනි මට දිදියන්න ගඟකට ඹුලා වෙලා
කෙසේ මා මහි යන්ද මම බිමට හා වෙලා
එහින්නට එපා වැඩි මගේ පෙති තලතලා...

සුංගි උන් කෑ ගඟයි අසඟ දෙඟ බල බලා
මල් කුමුදු නාම උන් දැක නැතිය ඝන වළා
වෙඩි මල් මෙච්චරම හිනිදු බව බල බලා
ඇයි විඩින්නෙ නදින් මගේ පෙති තල තලා....

දැනෙන්නේ නැතිය දැන් කිඹිවක්ම මට හොඳින්
වරිණු මල් සුඹද ටික ගලා යයි මට හොරෙන්
ඔසුවන්න බැ හිඟම බරව සැන හිනි බරින්
තල වරද මට කියන් වැහි වලාහක ඉගින්...

මට සැන්නේ එක දිනකි හැඩ වෙන්න මිහි මත
ම් දවසෙ ඔබ සැපිත් කලා මට උපහාර
පෙරුණි සිරුවා මාත් සිසෙන්නට මිහි මත
කැමත නම්වා ගිසෙන්නද වෙඩි මලක්ම...

ආර්.පී.දර්ශා ප්‍රබෝදනී
සංවර්ධන නිලධාරී
වරකාපොල ප්‍රාදේශීය ලේකම්කාර්යාලය

පුතුගේ

මතක හරි පිරුණු
හිත අස්සෙ හැංගිච්ච හිත
තනිමින් දිදුලන තුඩේ ආදරේ
සියුමැලි වතයි මා හද
නිවිලේ
දාරක ස්නේහයයි
නුඹගට දඳනේ
පුතුගේ උතුම් මව් පදවියයි
නුවණ මා ලැබුවේ

දුෂානි මධුභාෂිණී
සංවර්ධන නිලධාරී
බහුකාරය අංශය

අඩ සඳක් නිසා

ඉතමදාම්,
ඔබ එහ මග
වසකට පසු අදත්
මග ඉඩේම
බලවුණේ,
මෝකඳ
සොමිය සිසිලස
හිතට මෙණ ගතවත්
දැනුණු නිසා...
හමුදු ඔබ වෙත් පාරසිත්
සුසුරුදු සෙස ඇවිත්...
හිත බරයි...
හමුදු ආදරයි,
අකනට දෙන්නේ හෑ ඔව
සත්තයි ඔබ මයේමයි.

නිසංසලා පතිරණ
මෙහෙයුම් මැදිරිය

උපතිස්ස පී. නිශ්ශංක

නියගදාවකගේ කවිය

කිතිදු පෙතිමහ උදා විණිසැහ
හිරිඳ කඩාවැටී සැදා දුනවිල
කඩහොලුව හැඳු බිදනලද හැන
ඉතිං දැවෙන් හොලාගනුමියා

වාගෙ දෙසෙකාපුලෙන් කිතුදු තියෙනව
ඒණු අහ කුවිසුකුත් තියෙනව
හැතෑත් ඉවිකඩ කුදුවු පුදුනව
මගෙ පාටවත් පෙණක් නියෙනවි

තාත්තා හිටියානම්

තාරුවලටත් හියෙනවා ඇති
ඉඳහිට හරි
අහසින් බිමට බහින්නට
පොළවේ වැලිකැටත්
කොයනවා ඇති පාරක්
අහසේ හැඩ බලන්න යන්නට
දැවෙන ගිනී ගොඩක්
සිනල සුළඟ පහස කොයෙන්න ඇති
අහසේ ලස්සන
දේව විමනක සිට
තාත්තා බලනවා ඇති
තිත්ත මං දෙස
හිටියානම් අද්ටත් බයා මං ලඟ
තාත්තේ බබේ ඩුටි දෝණි
සතුටින් ඉන්නවා
තොඅනුමානය

කසුනි හසන්තිකා
මැටියගනේ

'පන්හිඳක මංසල්'

සාහිත්‍යය කලා මහෝත්සවය
අති උත්කර්ෂවත් අන්දමින් තෝලංගමුව මෑදි විදුහලේදී

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා සබරගමුව පළාත් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මෙන්ම අප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරනු ලැබූ 'පන්හිඳක මංසල' සාහිත්‍යය කලා මහෝත්සවය පසුගියදා අති උත්කර්ෂවත් අන්දමින් තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විය.

එහිදී කැළණිය විශ්ව විද්‍යාලයේ සංස්කෘතික අධ්‍යයන අංශයේ මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද ගී රස වින්දන වැඩසටහනකින් සහ සංස්කෘතිකාංග නිර්මාණ රැසකින් ඒ අවස්ථාව වර්ණවත් විය. එදින සාහිත්‍ය තරඟවලින් ජයග්‍රහණය කළ පාසල් අංගයේ සහ විවෘත තරඟවලින් ජයග්‍රාහකයන් රැසකට තෑග්ග සහ සහතිකපත් බෙදා දීම ද සිදු කෙරුණි.

වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ සහ සහකාර ප්‍රාදේශීය ලේකම් තුමියගේ මූලිකත්වයෙන් සංස්කෘතික නිලධාරීන් ඇතුලු කාර්යාලයේ නිලධාරීන්ගේ සාමූහික උත්සාහයෙන් පැවැති මේ උත්සවයට කෑගල්ල දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී උදයකාන්ත ගුණතිලක, කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් දිලිප් නිශාන්ත ගමලත් ,කෑගල්ල දිස්ත්‍රික් සමාදිධි අධ්‍යක්ෂ තුමිය ඇතුලු පරිපාලන නිලධාරීන් රැසක් මේ අවස්ථාවට සහභාගි විය

ශ්‍රුතාලේඛනා අංක 02

හරහට
1 අඩුව තැකහොත් වියැකි
5 සුම්ත්තගේ පුත්‍රයා
9 දිලීර
10 ආසන්න හෙවත් මද
11 දේශීය වෙදකමේ ඖෂධ වර්ගයකි
12 කැලෑරොදක
13 ලස්සන
15 දිග මැනීමේ ඒකකයකි
16 සතුට,සැප
18 රෝදය
20 සාහිත්‍යාංගයකි
21 මහත
22 හඳුනාගැනීමේ ප්‍රබලම සලකුණයි
23 රසකාරකය

පහළට
1 සක් දෙවිඳුන්ගේ අසුන
2 සැන්දෑව
3 මේවා වදිනවට කිසිවෙකු කැමති නැත
4 පූජනීය කාන්තාවකි
6 විශ්ව සාහිත්‍ය කෘතියක සිංහල පරිවර්තනය
7 වැඩවසම් යුගයේ ප්‍රබලයෙකි
8 ලෝක ඉතිහාසය වෙනස්කල නිපැයුමකි
14 එක්තරා සන්නිවේදකයෙකි
16 මනාලෙස ජනිතවූ
17 කාන්තාරය
19 දුෂ්කර ආහාරයක් ලෙස සැලකේ

ප්‍රහේලිකා අංක01හි නිවැරදි විසඳුම



පසුගිය කලාපයේ ඉදිරිපත් කරනලද
ප්‍රහේලිකා අංක01හි නිවැරදි විසඳුම අපවෙත එවා
ජයග්‍රහනයකර ඇත්තේ

බිතුති සිහංසා විජේරත්න
කෑ/තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලය

ප්‍රහේලිකා අංක 02 පුරවා එහි ඡායාරූපයක් 0706368628 යන අංකයට **whatsapp** කරන්න
නිවැරදිව ප්‍රහේලිකාව පුරවා එවන පළමුවැන්නාට විශේෂ තිලිණයක් ලබාදෙනු ලැබෙයි

පොඩ්ඩන්ගේ රූ රටා

කිසෙදි මිනුල්යා
3 වසර
කෑ / ඩඩලි සේනානායකම්.ම.වි

එච්.ජී.සෙනුදි සචිත්‍යා
4 වසර
දැදිගම ප්‍රාථමික පාසල

බී.එල්.සඟේලි යශෝදරා
1 වසර
කු/ ශාන්ත බර්නාඩ්ස් ආදර්ශ පාසල

කේ.ජී.දෙවුන්දි සිසිපබා
රාජකීය ජාත්‍යාන්තර පාසල

ගයින්දි නදුල්යා
2 වසර
කෑ/ධර්මසිරි සේනානායක ජාතික පාසල



සෙවිනි සෙනල්යා
4 වසර
ලයිසියම් ජාත්‍යන්තර පාසල

මයුන්දි හන්සාරා
2 වසර
කෑ/ වර / බෞද්ධ විද්‍යාලය

කිසෙදි මිනුල්යා
3 වසර
කෑ / ඩඩලි සේනානායකම්.ම.වි

දුන්න හැකිම ඵවක් ගන්න - කෘෂිකර්මාන්තයෙන් හොඳ ගමනක් යන්න පුඩුවන්

මහ පොළොවෙන් රන් අස්වනු රටට දෙන ගණිත සර්

2018 වසරේ ගොවි අභිමන් සම්මාන උළලේ කැගල්ල දිස්ත්‍රික්කයේ හොඳම කොම්පෝස්ට් නිෂ්පාදකයාට හිමි සම්මානය දිනා ගත්තේ ඔහුය. එම සම්මාන උළලේම හොඳම ව්‍යාපාරිකාව විදියට සම්මානය හිමි වූයේ ඔහුගේ ආදරණීය බිරිඳවය. හොඳම පුරන් කුඹුරු අස්වැද්දීමට හිමි සම්මානය ඔහු මූලිකත්වයෙන් කටයුතු කරන "ජයමඟ" තරුණ ගොවි සමාජයටයි. 2016 වසරේදී සබරගමු පළාතේ හොඳම කිරි සැපයුම්කරුට හිමි සම්මානය ද 2019 වසරේ හරසර ප්‍රාණාම උපහාරය ද දිනාගත්තේය ඔහු කුඩා ව්‍යාපාර ව්‍යවසායක චමිත් කුමාර ගමගේ මහතාය. ඔහු සොයා අපි ගලපිටමඩ අල්පිටිය ග්‍රාමයට ගියෙමු. මේ ඔහුත් සමග කළ කතා බහයි.

කුඩා ව්‍යාපාර ව්‍යවසායක
චමිත් කුමාර ගමගේ මහතා

මුලින්ම ඔබව හඳුන්වලා දෙමුද?

මම චමිත් කුමාර ගමගේ. කුඩා ව්‍යාපාර ව්‍යවසායකයෙක් වගේම ගණිත ගුරුවරයෙක්. සුමිගිරි නමින් කිරි ආශ්‍රිත කුඩා ව්‍යාපාරයක් හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ආයතනයක් වගේම ඉඳුවර නමින් පැළ කවානක් මම කරගෙන යනවා. ඒ ව්‍යාපාරවලට බිරිඳගේ සහායත් ලැබෙනවා. මට දරුවෝ තුන්දෙනයි. පුතා සබරගමු විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යාව පිඨයේ අධ්‍යාපනය ලබනවා, දුවලා දෙන්නා පාසල් අධ්‍යාපනය ලබනවා.

ඔබ භෞතික විද්‍යාව පිළිබඳ උපාධිධාරියක්. කොහොමද මේ කෘෂිකර්මාන්ත සම්බන්ධ කුඩා ව්‍යාපාරවලට යොමු වුණේ?

ඇත්තටම මම හොඳක් දිළිඳු පවුලක ඉපදුණු කෙනෙක්. මම කුඩා කාලයේ හැදුණේ මාතර මගේ මවගේ ගම පෙදෙසේ. මාතර තෝමස් කුමර විද්‍යාලයෙන් උසස් පෙළ හදාරලා කොළඹ විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යාවේදී උපාධිය ලබා ගන්නවා. මම ඊට පස්සේ ගලපිටමඩ අල්පිටිය මගේ ගමට එනවා. ඇවිත් දරුවන්ට අමතර පංති කරන්න පටන් ගත්තා. මට උපාධිධාරී රජයේ රැකියාවක් ලැබුණා. ඒත් මම ඒ වත විට ජයමඟ නමින් බාහිර පන්ති ඇකඩමියක් පටන් අරගෙන ගුරුවරු දහදෙනෙක් පමණ ඒ අකඩමියේ සේවය කරනවා. මම රැකියාව භාර ගන්නේ නැහැ. පූර්ණ කාලීනව ගුරුවරයෙක් විදියට බාහිර උපකාරක පංති කරගෙන ගියා.
එවි

ඊට පස්සේ?

සෑම වසරකම විභාගයෙන් සමත් වෙන දරුවෝ වගේම පොඩි පිරිසක් අසමත් වෙනවා. ඒ දරුවන්ට බොහෝ වෙලාවට අධ්‍යාපනය මග ඇරෙනවා. මම කල්පනා කළා මේ දරුවන්ට මොකද කරන්න ඕනේ. ඒ අය මෙතනින් අනුරුමොත් නොමගට යන්න තියෙන ඉඩකඩ වැඩියි. මම ඒ දරුවන්ට උදේ ඉඳන් හවස් වෙනකන් විෂයන් ඔක්කොම උගන්වන්න පටන් ගත්තා. ඒ එක්කම උදේ වරුවේ උගන්වලා හවස් වරුව කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක්ක එකතු වෙලා කෘෂි වගාවන් ගැන උගැන්නුවා. ප්‍රායෝගික පුහුණුවට මගේ වත්තට එක්කරගෙන ගිහින් එයාලට පාත්ති දාලා වගා කරන්න දෙනවා. සිංහල විෂයේ කව් පාඩම් ගන්නේ ඒ එළවලු පාත්තිවල ඉඳගෙන. දරුවෝ හරි කැමතියි. ඊට පස්සේ අස්වැන්න එකතු කරලා එයාලා පොළක් කරනවා. ඒ මුදල් එයාලා අතර බෙදා ගන්නවා. ඇත්තටම කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය කියන්නේ රැකියා මවන්න පුළුවන් ක්ෂේත්‍රයක්. ව්‍යවසායකයෙක් කියන්නේ රැකියා මවන්නෙක් මිසක් රැකියා සොයන්නෙක් නෙවෙයි. ඊට පස්සේ මම ජය මඟ නමින් තරුණ ගොවි සමාජයක් පටන් ගත්තා. ඔහොම දිගටම කරගෙන යන කොට පැළවලට අවශ්‍ය කාබනික පොහොර ලබා ගන්න එළ ගවයෝ ඇති කළා. ඒ විදියට 2014 කිරි ගව පොළක් ඇති කළා. ඊට පස්සේ 2015 දී කිරි ආශ්‍රිත නිෂ්පාදන කරන්න පටන් ගත්තා.

**අපි හැර්යට වැඩේ කරනවා නම් දැවී කරන්න
රාජ්‍ය ආයතන නිමඛනවා**

ඒ නිෂ්පාදන මොනවද?

මම ඒ නිෂ්පාදනවලට ගමේ කිරි ගොවියන්ගෙනුත් කිරි මිලදී ගත්තා. මාසෙකට කිරි ලීටර් 1400 ක වගේ නිෂ්පාදන හැදුවා. කිරි ටොෆි ,මුදවාපු කිරි, එළ කිරි වටලප්පන්, අයිස්ක්‍රීම් හා එළඟි තෙල්. මම මාජරින් හදන්න අවශ්‍ය දේනුම් ලබා ගත්තා. ඒත් අපට ඒ ව්‍යාපාරය පටන් ගන්න බැරි වුණා.

ඒ ඇයි?

කොරෝනා වසංගතයත් එක්ක කිරි ආශ්‍රිත නිෂ්පාදනය කඩන් වැටුණා. මොකද ගම්බදව කිරි දියර ඉල්ලුම් වැඩි වීමත් සමග කිරි ගොවීන් වැඩි මිලකට කිරි අලෙවි කරන්න පටන් ගත්තා. ඒ වගේම අපේ යෝගට වගේ නිෂ්පාදන හදන්න වතුර එකතු කරපු කිරිවලින් බැහැ . සම්භර කිරි ගොවියෝ කිරිවලට වතුර එකතු කරන්න පටන් ගත්තා. කිරිවල කත්තිය ඒ නිසා බාල වුණා. දියර කිරි ගම්බදව අලෙවි කරන කොට වතුර එකතු කරලා වැඩි මිලකට දෙන්න පුළුවන්.

මේ කාරණා නිසා අපේ නිෂ්පාදනවලට අවශ්‍යය කිරි ප්‍රමාණය සපුරාගන්න බැරි වුණා. අපේ හිටපු කිරි ගවයෝ දෙන්නෙක් වැඩි දවසක හොරු අරගෙන ගිහින් තිබුණා. ඒ වගේ කරදරවලටත් අපට මුහුණ දෙන්න සිදු වුණා. ඒ වගේම විදුලි බිල වැඩි වීම ඉන්ධන මිල වැඩි වීම නිසා ප්‍රවාහන වියදම් වැඩි වීම නිසා කිරි නිෂ්පාදන කර්මාන්තය නාවකාලිකව නතර කරන්න සිදු වුණා.

කොරෝනා නිසා කිරි ගොවියන්ගෙන් ලැබෙන කිරි අඩු වුණා මොකද ඒ අය දියර කිරි විදියට වැඩි මිලකට අලෙවි කරන්න පටන් ගත්තා විදුලි බිල වැඩි වීමත් නිසා කිරි කර්මාන්තය අබාල වෙන්න බල පෑවා

Y.F.C කොම්පෝස්ට් පොහොර

එළඟි තෙල්

ගමේ කිරි ගොවියන්ගේ කිරි එකතු කරලා මුදවාපු කිරි, අයිස්ක්‍රීම් කිරි ටොෆි, එළඟි තෙල්, වටලප්පන්, යෝගට් හැදුවා ඒ ගවයන්ගේ ගොම අරගෙන කොම්පෝස්ට් පොහොර හැදුවා ඒ විතරක් නොවෙයි ඒ ඉවතලන ගොමවලින් මම ඔයෝ ෆෑස් එකක් නිර්මාණය කළා. මගේ කර්මාන්තයට වගේම ගෙදර් දෙදෙනික උයන පිහිනා කටයුතුවලටත් යොදා ගන්නවා ෆෑස් එක නිර්මාණය වෙලා යන දියර්ය කොම්පෝස්ට් පොහොර්වලට වගේම දියර් පොහොර්ක් විදියට මම අලෙවි කරනවා

ඉඳුවර පැල කවානත හා
සුමිගිරි කිරි නිෂ්පාදන

කොම්පෝස්ට් පොහොර හා කිරි නිෂ්පාදනයෙන් රැකියා මවන්න පුළුවන්

ලාභ ලබමින් තිබුණු කිරි නිෂ්පාදන කර්මාන්තය කඩා වැටීමත් සමඟ පැමිණි අභියෝගවලට ඔබ කොහොමද මුහුණ දුන්නේ?

කොහොමත් සාර්ථක ව්‍යවසායකයෙක් වෙනවනම් වෙනස් වෙන වෙළඳ පොළට සාර්ථක මුහුණ දෙන්න ඕනෑ. ඒ වගේම සියල්ල නැති වුණත් මනසින් වැටෙන කෙනෙක් වෙන්න බෑනෑ. ඒ වගේම නිර්මාණශීලී වගේම නමැයිලි හැකියාවක් තියෙන්න ඕනෑ තමන්ගේ කර්මාන්තය ලාභ ලබන විදියට වෙනස් කරන්න. කිරි නිෂ්පාදන කර්මාන්තය නතර වෙනවත් සමගම අපි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය වැඩි කළා. ඒ වන විට රසායනික පොහොර ආනයනය නතර වෙලා තිබුණේ. 2020 වසරේ අග භාගය වන විට මාසික පොහොර නිෂ්පාදනය ටොන් 12 ක් හා දියර පොහොර ලීටර් 1000 ක් ඉක්මවා වෙළඳ පොළට එකතු කරන්න පුළුවන් වුණා. දැන් ආයෙත් රසායනික පොහොර නිෂ්පාදනය ආවිනය නිසා කාබනික පොහොරවල ඉල්ලුම අඩු වෙලා.

ඒ අභියෝගය ජයගන්න මොනවගේ සූදානමක්ද තියෙන්නේ?

මේ දිනවල පැළ හා බීජවලට වැඩි ඉල්ලුමක් තියෙනවා. අපේ ඉඳුරා පැළ තවාතේ පැළ හා බීජ ගම්මි ගමට ගෙකියන ජංගම සේවයක් තිබුණා. ඉන්ධන මිල වැඩි වීම නිසා තාවකාලිකව නතර කරන්න වුණා. ඒ වගේම කිරි ගව ගාල පුළුල් කරගෙන නැවත කිරි නිෂ්පාදනය පටන් ගන්න මේ දවස්වල උත්සාහ කරනවා. ලෙනගල පන්සලේ හාමුදුරුවෝ සමඟ එකතු වෙලා ලෙනගල පන්සලේ කිරි ගව ගාලක් පටන් අරන් තියෙනවා. අපට කිරි ගව ගාල වැඩි වුණොත් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය වැඩි කරගන්න පුළුවන්. ඒ වගේම බයෝ ගෑස් නිෂ්පාදනයෙන් තමයි ගෙදර ගෑස් පරිභෝජනය සපුරා ගන්නේ. වැඩි වෙන විදුල බිලට පිළියමක් විදියට කිරි නිෂ්පාදන කර්මාන්තයට යන කාපය බයෝ ගෑස් හරහා සපුරාගන්න උත්සාහ කරනවා. ඒ වගේම විජලනය කරන ලද ආහාර හා පාන වර්ග අපනයනය කරන්න සූදානම් වෙනවා. දෙල්, පොළොස්, කොස්, දුරියන් ,කෙසෙල්, දිවුල් ,හීන් බෝවිටියා ,නිල් කටරොළු, වැල් පෙනෙල, මුරුංගා කොළ ,තෙඹු හා ගොටුකොළ දේශීය වෙළඳ පොළට එකතු කිරීම තමයි ඊළඟ උත්සාහය. මේ සඳහා කාබනිකව වගා කිරීමට කැමැති දැනටමත් වගා කිරීමට කැමැති අයට අපිත් එක්ක එකතු වෙන්න පුළුවන්. අපි පැළ හා කාබනික පොහොර ලබා දීලා අපේ පූර්ණ අධීක්ෂණය යටතේ වගාව පවත්වාගෙන යන්න උදව් කරනවා. ඊට පස්සේ අස්වැන්න එයාලගෙන් සාධාරණ මිලදී ගන්නවා. කැමති කෙනෙක් 0768960424 කතා කරන්න .

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිලිබඳ වැඩමුලුවක්

ඔබට මේ කුඩා ව්‍යාපාර දියුණු කරගන්න මොනවගේ සහායක් ද බලාපොරොත්තු වෙන්නේ?

මට අවශ්‍යය තාක්ෂණික දැනුම තියෙනවා. ප්‍රාග්ධනය නැහැ. යම්කිසි ආයතනයක් හරි ව්‍යාපාරිකයෙක් හරි මට අනුග්‍රහය දෙනවනම් ඒ අයටත් ලාභ උපයලා දෙන ව්‍යාපාර යක් කරන්න මට ශක්තිය තියෙනවා.

ආධුනික ව්‍යවසායකයකුට දෙන්න කැමැති උපදෙස මොකක්ද?

සැලසුම් කරන්න. බාධක හඳුනාගන්න. අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් උපදෙස්,දැනුම හා පුහුණුව ලබා ගන්න. තමන් ගැන විශ්වාසයෙන් ව්‍යාපාරය ආරම්භ කරන්න. දිනුම ළඟට වඩා දුර කියලා හිතන්න.

ඔබේ අධ්‍යාපන මට්ටමත් සමඟ සීතල සුවපහසු කාමරයකට වෙලා තිරණ හිත්දූ ගනිමින් රාජකාරී ජීවිතයක් ගත කරන්න පුළුවන් වටපිටාවක් ඔබට තිබෙද්දී ඇයි මේ කර්කෂක පොළවක් එක්ක පොර බදිමින් ජීවිතේ ගෙනියන්න හිතුවේ?

තමන්ගේ ආත්ම තෘප්තිය ලබන විදිය එක් එක් පුද්ගලයට වෙනස්. මට තියෙන්නේ අයිතිවාසිකම් දිනාගන්නවට වඩා වගකීම් ඉටු කරන මානසිකත්වයක්. ගුරුවරයෙක් විදියට මගෙන් ඉගෙන ගන්තු දරුවන් අද රජයේ ඉහළ තනතුරු දරනවා . ඒ වගේම සාර්ථක ව්‍යවසායකයන් විදියට සාර්ථකව තමන්ගේ ජීවිතය ගෙන යනවා. ඒ තෘප්තිය මට ඇති. 2017 වසරේ ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එක්ක එකතු වෙලා අක්කර හයක පමණ පුරන් කුඹුරු යායක් අස් වැද්දුවා. කෘෂිකර්මාන්තය ආශ්‍රිතව රැකියා රැසක් නිර්මාණය කළා. පූජ්‍ය ගලපිටමඩ ඉන්ද්‍රරතන නාහිමියන්ගේ මය පෙන්වීම් යටතේ සබරගමුව විශ්ව විද්‍යාලයේ හිටපු ජපන් භාෂා උපදේශක ඔයිමා මසරු මහතාගේ සහායෙන් පාසල්වලට දහම් පාසල්වලට භෞතික සම්පත් රැසක් ලබා දීලා තියෙනවා. රැකියාවක් කරන කෙනෙකුට වඩා මම ගමන් එක්ක එකතු වෙලා පොදු වැඩවලට සහයෝගය එදා වගේම අදත් ලබා දෙනවා. මම භෞතිකව නොවුණත් මානසිකව තෘප්තිමත් මනුස්සයෙක්.

කුඩා ව්‍යාපාර ව්‍යවසායකයෙක් විදියට මේ පැමිණි ගමන් මගෙහි ස්තුති කරන්න කැමැති කාටද?

ගොඩක් අය ඉන්නවා. විශේෂයෙන් ප්‍රාදේශීය ලේකම්තුමාට, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියට, මානව සම්පත් නිලධාරීන්ට, කුඩා ව්‍යාපාර අංශයට, කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ සරගමු පළාත් අධ්‍යක්ෂතුමාට, නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ තුමියට, දදිගම කෘෂිකර්ම උපදේශන තුමියට, පශු වෛද්‍ය කාර්යාලයට, ජයමග ත ළගා. ස සාමාජිකයන්ට විශේෂයෙන් ස්තුති කරන්න ඕනෑ.

සංස්කාරක

මට රාජ්‍ය ආයතනවලින් අවශ්‍යය උපදේශනය හා උපකාරණ ලැබුණා

ජයමග තරුණ ගොවි සංවිධානය හැදුවෙ අතර්මගදි පාසල හැර යන දරුවන්ට

කෙටි බලා

ඔබගේ කාර්යයන් පහසු කර ගැනීම සඳහා



මෙම සබැඳිය ඔස්සේ වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලීය
නිල වෙබ් අඩවියවෙත පිවිසෙන්න

http://www.warakapola.ds.gov.lk/index.php/en/



නිසංසලා පතිරණ - මෙහෙයුම් මැදිරිය

ඔබටත් ප්‍රාණ ඉඩහසර....

වරකාපොල කොට්ඨාසයේ ඔබෙත් දරුවන්ගෙත් නිර්මාණශීලි හැකියාවන්ට අවස්ථාව ලබාදීමට අප සුදානම්.
ප්‍රාණ තෛමාසික සඟරාවේ ලබන කලාපයට ඔබේ නිර්මාණ praanamagazine@gmail.com හෝ
0706368628 දුරකතන අංකයට Whatsapp කරන්න.
ඔබේ අදහස්,යෝජනා ,ගැටළු ද අපට යොමු කරන්න..
මේ ඉඩහසර ඒ සඳහාමය.

-සංස්කාරක-

සබරගමුවේ ඉතිහාසය ලොවට කියන
ලෙනගල රජමහා විහාරය

සබරගමුවේ කහගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කෝට්ඨාසයේ පහළ ලෙනගල විහිටා ඇති චෛත්‍යාකෘතික වවිතාකමකින් යුත් පුදබිමක් ලෙස ලෙනගල රජමහා විහාරස්ථානය සැලකිය හැකියි. එපමණක් නොව ඉතිහාසය, සිතුවම් සහ මූර්ති, අවට පරිසරය හා පිහිටීම යන සියලුම අංග ඉතා හොඳින් සංවිධානය වී ඇති විහාරස්ථානයක් ලෙස ද මෙය සැලකිය හැකියි.

අනුරාධපුර යුගයේ එළාමිඬා රජ දවස දෙමළ රජවරුන් සමඟ යුධ වැදී පරාජය වී වසර 14 ක් වනගතව සැඟ වී සෝනාව රැක් කිරීමට රිදී කිඩි ස්ථානයක් ලෙසද මේ ලෙනගල විහාරස්ථානය සැලකේ එහිදි නම සෝනාව සමඟ රිදී කිඩිමට උදව් කළ ස්ථානවලට කෘතගුණ සැලකීමක් ලෙස මෙය කරවූ බව චෛත්‍යාකෘතික ලේඛණවල හමු වේ එපමණක් නොව මෙහි ඉතිහාසය රාවණා යුගය දක්වා දිවෙන ඡායාවක් ඇත එනම් රාවණා රජු නම දඩුමොණරා නම් වාහනය නැවැත්ත වූ ස්ථානය ලෙසද ප්‍රකටය





සබරගමු පළාතටම ඇති බ්‍රාහ්මී අක්ෂර සහිත ලොකුම අකුරුවලින් ලියවුණු සෙල්ලිපිය ලෙනගල ගලෙහි පැවතීම ද මෙහි විශේෂත්වයකි. එමෙන්ම ලෙනගල විහාර භූමිය සතු ගල් ලෙන් 28 පැවතීමතීම ද එයින් ගල් නවයකම කම කටාරන් කොටා තිබීමත් සුවිශේෂිය. ඒ ගල් ලෙන්වල භාවනායෝගීව භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කර ඇත. ශ්‍රී ලංකාවේ දෙවන උසම ගල් උළුවස්ස ඇත්තේද මේ විහාරස්ථානයේය. ලෙනගල සිට සල්ගල කන්ද දක්ව උමං මාර්ගයක් තිබී ඇති අතර වළගම්බා රජු එහි ගමන්කළ බවද ජනප්‍රවාදයේ පවතියි.

ස්වභාව සෞන්දර්යයෙන් අපූර්ව පෙතිහාසික වවිතාකමක් ඇති මේ විහාරස්ථානයට වරකාපොල කවනැල්ල මාර්ගයේ ඇති ගලපිටමඩ නගරය මැදින් කොටියාකුඹුර දක්වා දිවෙන මාර්ගයෙන් ලඟා විය හැකිය.

සංස්කාරක



ප්‍රාණ

ඔබ වෙනුවෙන්මයි

වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ
සේවයෙහි නියුතු ඔබෙන්
ඔබේ දරුවන්ගෙන්

නිර්මාණශීලී
හැකියාවන්ට

අවස්ථාව ලබාදීමට
අප සුදානම්...

ඔබගේ
ගද්‍ය/පද්‍ය/සිතුවිලි නිර්මාණ
විශේෂාංග ලිපි

ප්‍රාණ තෛමාසික අන්තර්ජාල සඟරාවේ

මීළඟ කලාපය සඳහා

අපවෙත එවන්න...

praanamagazine@gmail.com
0706368628 (Whatsapp)

සියල්ලන්ටම වඩා දරුවන් 2023

ලෝක ළමා දින සැමරුම

ගෙවෙන සෑම තත්පරයකම අපේ දරුවන්ගේය. ඔවුන්ට යහපත් සුරක්ෂිත පරිසරයක් සොඳ සැකීම වැඩිහිටියන්ගේ යුතුකමය.
අහංකාර යහපත් සමාජයකට අද සොඳ දරු කෙලක් සෑදීම අපේ වගකීමය.
සෑම දරුවෙකුම සතුට පිරි ඉනිරෙන දවසක් විය යුතුය.
සෑම දරුවකුගේම කුස පිරෙන දවසක් විය යුතුය.
ඒ දවස එක දවසක් නොව සෑම දවසක් විය යුතුය.
කුරුළු පියාපතක් ගිල් අහසේ පියාඹනවා සේ
නිදහස් ලෝකයක දරුවන්ට ඉගිල යන්නට
හෙට දවසක් උදා විය යුතුමය....

සියල්ලන්ටම වඩා දරුවන් වටී කේමාව කර්ගත් මෙවර ලෝක ළමා දින සැමරුම මංගෙදර කණිෂ්ඨ විද්‍යාලයේදී සාර්ථක ලෙස 2023/10/03 දින පැවැත්විණි. එහිදී පාසල් දරුවන් සඳහා පෞර්ෂ සංවර්ධනය හා නායකත්ව කුසලතා ඔප්නැත්වීමේ වැඩසටහනක් සංවිධානය කර තිබූ අතර දරුවන් හා දෙමාපියන් දැනුවත් කිරීම වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සඳිවි අත්තනායක මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

මදුරුපිටිය වසමෙන් චිත්‍ර හා පද්‍ය රචනා තරගයක්

වෙනිවැල්කඩුව දහම් පාසල් දරුවන්ට විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක්

බුරුන්නාව ළමා සමාජයෙන් බෙලි මල් දන්සැළක් හා සිල් සමාදන් වූවන්ට සවස ශිලන්පස පිරිනැමීම බුරුන්නාව විහාරස්ථානයේදී

ළමා දිනයට සමගාමීව පෙර පාසල් දරුවන්ට පැවැත් වූ විනෝදාත්මක වැඩසටහනක් යද්දෙහිමුල්ල වසමෙන්

වැඩිහිටි දිනය නිමිත්තෙන් කෝදාපාලුව වසමේ පැවැති විශේෂ වෛද්‍යසායනය

වැඩිහිටි දිනය වෙනුවෙන් නිවටුව වසමේ විශේෂ ධර්මදේශනාවක්

වැඩිහිටි දිනය නිමිත්තෙන් පලමුරේ වසමේ ධර්ම දේශනාවක්

අඹේපුස්ස තරුපලස ළමා සමාජයෙන් අපූරු පැදුරු සාජ්ජයක්

සුබ පැතුම්

අම්මා

මල් ඉපදුනත් මල් අහුවැටුනි අම්මා
මිහිර හැළුනත් මිහිර අහුවැටුනි අම්මා
මේ පණිනයන පණිනි අම්මයි අම්මා
පින්' සෑදුනත් පින්' අහුවැටුනි අම්මා

පිණි තුටියකු සිසිලසුයි අම්මා
බුදු කුටියක සඳකැස්මයි අම්මා
මේ සෞම්‍යතාව මැද සිසිලසුයි අම්මා
බුදු හිමි පැති නැහා බුදුනියි අම්මා
වලාකුලේ අඳුරුවැටුනි අම්මා
නලලා ලෙලේදියුපහරයි අම්මා
සඳ නාහොත හඬ ඔබමයි අම්මා
සිහිල ලෙස ලොව දකුණුම අම්මා

ඉරට වඩිනා දුකක්නා අම්මා
සඳට වඩිනා දුකක්නා අම්මා
බුදුන්ට මෙලොවට විකාරලේ අම්මා
ලොවේ සුවඳ හඳ ප්‍රබෝධය අම්මා

තුමෙන නොමිමෙන ජීවය අම්මා
සසර පුරා සෙවූ සැනසුම අම්මා
බුදුන්ම දෙසල දහමින් අම්මා
සැනසී සසර ඵලී සිදුනින අම්මා

ඒ.ඇ.සිලින්
සමගි වැඩිහිටි සමිතිය
තාලුගල

හෙට දිනන ප්‍රකඹට කියනෙමි
(ලොව්ම දිනුමට ඇමතුමක්)

අන්දකාරෙකැ සිහින් විඳුවින
දුක උරුම නැත සදා කල්හිම
ගුරුන් කී බස් හදැ දරා මම
මගකදී හමුවිය...සැබෑ ලෙසටම
නමුත් රාහුගේ කීම මෙන් නොව
රිදුම් ඉවසන වෙරින් බර්වුණ
මහා ප්‍රඥා අත දරා මම
උහන්වම් මතු හෙට දිනන පුත
කිසිදු අයුරින් හැඹූ පා අයුරු ඉදිරියෙන
නොගන් පසුබටෑ නොවින් අලසවැ
සිප් සයුර කර අවය
බිඳ දමා චින දුලි වැලි කැද
මහා ඉවයි ලොනිම බලමින
දිනන් ලොව පුත..
ලෝක ජාගතෙක් මෙලෙස කී කළ
,වැරදි ලැබ දැන ඒ වැරදි නොකරන්නට උගනමි,
එකී ලෙස තුබ වැරදි නොකෑරම
චන්දුයා ඉලක්කය තුබ විදින කළ
ඊ හිස නරවැක හෝ වැදෙනබව
මතක ඇතිවම
දියුණෙන් දියුණට යන්...
ලෝකයෙන් බබ පා නමදිනු ඇත..
සිවි හෙළයම දිනාවනු මැන...
බබවරෙ මේ ආරාධනා..
හෙට දිනනට ආරාධනා..

ඉදුරංගනී නිමසරා
13 වසර

ඇවසන් කාර්තුව

සීතල මද පවන
ඔබ ඇවිත් යන බව පවසයි
කුලුදුල් හාදුව
සදාතනික බැඳීමකි,
ගතින් නොව සිතින් මා
පෙම් දැහැනේ වෙලයි
සදා මගේ වන මගේ නොවන
රන් කැරව ඔබමයි
ආත්මීය සෙනහස
විදිමු අපි මතු භව යේ
අවසන් කාර්තුව
මතක පොතට එක් කර

නිසංසලා පතිරණ
මෙහෙයුම් මැදිරිය

චරිවිව් බිහිනියෙන්
ඔවදවුණු
ඇවි ගුලියකින්
හැඩතෙරුණු
ගොම ඇට්ටකින්
විරිඳුවුණු
නෙත.ගත.වයද
දුක්වැකුණු
නිදොස් තිවසකට
හිතබැලුණු
තලුවූ
තව වරදුරට
ලොබකිතුණු
දහස මාලිගා
මතවුණු
වියල ඇදුරකට
ඔදවුවුණු
මගෙ දැද කැළට
කිරිනොවුණු
ඉවවි ගොලුණි
දුකඳරුණු...
හිරෝමි කහගල්ල
තුල්හිරිය

මැයි මාර හෙවනක හිද

සිහිල් මිදුම් රැලි අතර
බදුලු කෝච්චිය හෙම්හිට
හඬ නගමින් දුවනයුරු විද
කුලුබඩු සුවඳින් මත් ව
නොඅඩුව රසකාරකයක්ව ලියු ලියමන් එක්ව
ගත කල පිවිතය කෙටි වුවද ආදරණීයයි

පිවිත කාලයම අමතක නොවන සදා නොමැකෙන
සටහන් තබා ගිය ඔබ වෙනුවෙන්

-රසිකා දසනායක-

ලෝකය යවහින්නේ ඇවිත් යන අය යහා ඉන්න අය අතරින් නැගෙන
වේදනාවෙන්..ඇවිත් යන්න හියෙමින අය ඇවිත් යනවා..
ඉන්න හියෙමින අය ඉන්නවා
- මැයිමාර්ගප්‍රසංගය -
මහින්ද ප්‍රසාද් මිවල්ගමුල කෘතිය ඇසුරිණි

මගේ බාල විය

මගේ බාලය මතක්වියහිට - සිතේ ඇතිවිය සුන්දරත්වය
සිහා සිමතල හොඟක - සම වියෙන් යහගුණියන් සමග
ඇතු දොලවිවිල පිහිණුහැටි - අම්මත කොවේ සිහිදා
කොයම් කපන කාලෙ - අප්පච්චි සමග
අම්බරවෙත් රෑකක් බැගෙහෙන - රෑ එලෙවෙකුරා
කොල මැඩු සැටි - පිපුරන කළු උඩ
පිහිනි නෑසූ සැටි - ඉතා රසවත් ගුරෙස මතකයට නගමි
අපේ එවන් සුන්දර කාලයක් - සිහිදා ඒදු අපිට
අපේ සිවිත දරුවන්ගට - ඔහෙ එවන් සුන්දර කාලයක්
ලිවිමට බොහෝදේ අහෙන් - නිම කල නොහැක ලියා
එවන් සුන්දර ළමාවිය

එම්.ඒ.සතරංකෝණ් මිනිතේ
ප්‍රාර්ථනා වැඩිහිටි සමිතිය
බඟල කලුගල

මතට ලොල්වී අකාලයේ මිලිත වන
වටිනා ජීවිතයකට
හරි මග කියාදෙන්න අපි සූදානම්...

අදුරේ අතපතගා
ජීවිතයේ මිහිරියාව සොයන්නන්ට
ජීවිතය කියාදෙන්නට එක්වෙමු.....

මතින් තොර හෙටක් - තේමාව මුල් කර
ගනිමින් වරකාපොල ප්‍රාදේශීය ලේකම්
කාර්යාලය මගින් නිර්මාණය කරනු ලැබූ

අන්ධෝරිස්ගේ සුරලොව

වීදි නාට්‍ය ඔබ ගේ ප්‍රදේශයට, පාසලට
ගෙන්වා ගැනීමේ හැකියාව පවතී...

නාට්‍ය සැම්බන්ධ කාර් ගැනීම් සඳහා
මෙන්දුවිය නිවාරණ නිලධාරී
ආර්.පී.ඩී.ප්‍රබෝදනී
077657675

සෑම ගමකටම පුස්තකාලයක්

සෑම ගමකටම පුස්තකාලයක් තේමා කරගනිමින් කොළඹ ළමා පොත් සංගමය විසින් විශේෂ වැඩසටහනක් ආරම්භ කර තිබේ. එහිදී සෑම ගමකටම පුස්තකාලයක් ආරම්භ කර විශේෂයෙන්ම දරුවන්ව කියවීමට යොමු කර උසස් රසවින්දන හැකියාවක් ඇති කිරීම මෙහි අරමුණයි. එහිදී ළමා මනසට සුදුසු පොත්පත් ඉතා අඩු මුදලට මුදුණය කර ළමා ලේඛකයින් බිහි කිරීම ද මේ අතර වේ. ඔබේ ගමටත් පුස්තකාලයක් ආරම්භ කිරීමට කැමති නම් මේ 0766499083 අංකයට කතා කරන්න. ගඟක් වර්ණ ගැන්වීමට අවශ්‍යනම් එහි ජලයට වර්ණ එකතු නොකර ගඟෙහි දිය උල්පතට වර්ණ එකතු කිරීමට කව යුතු කළ යුතු බවත් යහපත් මිනිසුන් තැනීමට නම් යහපත් දරුවන් යුතු බව පවසමින් නව ළමා පුස්තකාලයක් ආරම්භ කිරීමට රු.10000 ක මුදලකට රු.20000ට වටිනාකමකින් යුත් පොත් ලබා දෙන බව කොළඹ ළමා පොත් සංගමයේ සභාපති ධර්මදේව අම්බලන්පිටිය මහතා ප්‍රාණ සමග පැවසීය

යකඩ සපත්තු

ලස්සන ලොකෙක ඉපදිලා - නූපන් හෙට ගැන නොතැවිලා.....

සිංදුවකට කං තියාන ඉද්දි එකපාරටම ඇහුණ සිංදුවක්. ඒත් එක්කම මට නින්දගියා. එක එක හීන කැලි පේන්න පටංගත්ත.ටික වෙලාවකිං මං හිටියෙ පාට පාට ලෝකෙක පාවෙන ගමං. එකපාරටම පොඩිම පොඩි පොඩි එකෙක් තුවක්කුවක් දික්කරගෙන මං දිහාවට දුවං ආව.

ඩෝං ඩෝං ඩෝං

ඌ මට වෙඩි පහ හයක් තිබ්බ. වෙලාවට මං වෙඩි වඩින්නෙ නැති ඇඳුමක් ඇදං හිටියෙ. මං අඩි දෙකෙන් තුනෙන් පොඩි එකාට කිට්ටු උනා. ඌ හිටියේ අත්කොට බැනියමකුයි කලිසං කොටෙකුයි ඇදං. ඌගෙ මූණ වැහෙන්න ඇස් දෙකට හීරෝ මාස්ක් එකක් දාගෙන හිටියෙ. මං ඌගෙ කනෙං ඇදල ළඟට අරං තුවක්කුව උදුරගත්ත. හීරෝ මාස්ක් එකත් ගලවල විසික්කරල දැම්ම. ඌ පුදුම කේන්තියෙන් මංදිහා බලං හිටියෙ. මොකක් ??? මාව කඩාගෙන වැටෙන්න පටංගත්ත. මේ පොඩි එකාගෙන් මට පේන්න පටංගත්තෙ පොඩිකාලෙ හිටපු මාවමයි. මං හොඳට උගෙ මූණට කිට්ටුවෙලා බැලුව. ඔව්.ඒ මමමයි. මට හිතාගන්න අමාරුයි මේ වෙන්නෙ මොකක්ද කියල. මගෙ පොඩිකාලෙ හිටපු මං තුවක්කුවක් අරං මගෙ ඉස්සරහට ඇවිත් මටම වෙඩි තිබ්බ. දැනුත් ඌ මගේ දිහා කන්නවගේ බලං ඉන්නෙ.

"මාව අදුරන්න බැරිද?" මං ඇහුව.

"මං කොහොමද තමුසෙව අදුරන්නෙ. මං එව්වෙ තමුසෙට වෙඩිතියල මරලදාන්න" ඌ කීව.

මට දැං හෙන ප්‍රෙහේලිකාවක් ඔලුවෙ කැරකෙනව.

"කවුද එව්වෙ? ඇයි මාව මරන්නෙ?" ඌ හිනාවෙන්න පටංගත්ත.

"තමුසෙ මහ කාලකණ්ණියෙක්" ඌ කීව.

එකපාරටම මාව ආයෙත් පාවෙන්න පටංගත්ත. මං ගිහිං නතරඋනේ යකඩ සපත්තුවක් යට. මාව ටිකෙං ටික යකඩ සපත්තුවෙං තදවෙන්න පටංගත්ත. ඒත් එක්කම යකඩ සපත්තුව කතාකරන්නත් පටංගත්ත.

"එහෙනම් උබ බේරුණා. ඒත් දැන් උබට බේරුමක් නෑ. උබ හැදුවෙ අපිව පාගන්න. බලපන් උබට කරන වැඩේ"

මං අමාරුවෙං ඔලුව උස්සලා ඇස්දෙක වටේ කැරකෙව්ව. මං දැක්කෙ යකඩ සපත්තුවලිං පාගං හිටපු සෙනග ගොඩක්. ඔව්. මං අදුරන කීපදෙනෙකුගෙ මූණුත් මට හොයාගන්න පුලුවං උණා. ඒත් එක්කම දැක්කෙ රතුපාට තරුවක් පායං එනව. ඒකෙ රස්නෙටද මංද ටිකවෙලාවකිං යකඩ සපත්තු දියවෙංන පටංගත්ත. ඒත් මට දැනුනෙ පුදුම හීතලක්. ඒ හීතලේ රස දැනෙද්දිම මට ආයෙ සිංදුව ඇහෙංන පටං ගත්ත.

ලස්සන ලෝකෙක ඉපදිලා....

ඔව්.මට ඇහැරුණා...

යසින්ත ප්‍රදීප්මාල් - සංවර්ධන නිලධාරී

නිලූ ප්‍රියදර්ශනී
සංවර්ධන නිලධාරී
ඒඩිඩිගල වසම

නිලක්ෂා ජීවනී
සංවර්ධන නිලධාරී
එලිපත්ගමුවවසම

ප්‍රාණ ත්‍රෛමාසික අන්තර්ජාල සඟරාව
වරකාපොල ප්‍රදේශය ලේකම් කාර්යාලය
වරකාපොල
praanamagazine@gmail.com

උපදේශකත්වය
වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලීය ප්‍රාදේශීය ලේකම්
රංගන සජීව
වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලීය සහකාර ප්‍රාදේශීය ලේකම්
කෞෂල්‍යා බණ්ඩාර

සංස්කාරක
වලානි ධිවන්ති හේරත් (සංවර්ධන නිලධාරී) 0776057275

සම්බන්ධීකරණ සහය
ධනේෂි ජයතිලක (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර)
නිසංසලා පතිරණ (සංවර්ධන නිලධාරී)
ශාන්ත පුෂ්පකුමාර (සංවර්ධන නිලධාරී)

පරිගණක අක්ෂර හා පිටු සැකසුම
යසින්ත ප්‍රදීප්මාල් (සංවර්ධන නිලධාරී) 0712637846

සංවිධානය
මාධ්‍ය ඒකකය
වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය